1st Place Winner
National Productivity
Award 2020

SLSI ISO 9001

SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. : CSS/03/06/ANN/TR/2026 | ඔබේ අංකය / உமது இல / Your Ref. : | දිනය / திகதி / Date : 2026.04.21 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

## වාර්ෂික ස්ථාන මාරු - 2026

## දකුණු පළාත්, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - ගාල්ල ප්‍රධාන කාර්යාලයේ සහ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ සංවර්ධන නිලධාරී සහ කළමනාකරණ සේවා නිලධාරී පුරප්පාඩු සම්පූර්ණ කිරීම

උක්ත කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත්, පළාත් ආදායම් කොමසාරිස්ගේ අංක SPPRD/A2/2/2/3 හා 2026.03.19 දිනැති ලිපිය ද, 2026.04.09 දිනැති ලිපිය මඟින් යොමු කරන ලද ස්ථාන මාරු අයදුම්පත ද හා බැදේ.

02. එමඟින්, පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයෙහි දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරඟ විභාගය - 2025 සමත් නිලධාරිනියක සිටින බැවින් එකී කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරියකුගේ පුරප්පාඩුවක් ඇති වන බව දැනුම් දී ඇති අතර, මෙය හදිසියේ ඇති වූ පුරප්පාඩුවක් හේතුවෙන් ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ 01/2026 හි උපදෙස් මාලාව - 04 මඟින් එය ප්‍රසිද්ධ කිරීමට නොහැකි විය.

03. එසේම, පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරිනියක් ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ 01/2026 හි 7.10 වගන්තිය අනුව, වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු ඉල්ලීම් කර ඇත.

| පුරප්පාඩු වන තනතුර | පුරප්පාඩු වන ශ්‍රේණිය | පුරප්පාඩුව ඇති වන ස්ථානය |
|---|---|---|
| සංවර්ධන නිලධාරී | III | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - ගාල්ල ප්‍රධාන කාර්යාලය |
| කළමනාකරණ සේවා නිලධාරී | I | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - මාතර ප්‍රාදේශීය කාර්යාලය |

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary : 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office : 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax : 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail : chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site : www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

04. ඒ අනුව, මෙවර 2026 - වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල රැස් වන අවස්ථාවේදී එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නිලධාරීන් පත් කර ගැනීම සඳහා නැවත අයදුම් පත් කැඳවීමට පහත සඳහන් පරිදි තීරණය කර ඇත.

| | |
|---|---|
| **සංවර්ධන නිලධාරී සේවය** | |
| ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන සඳහා දැනටමත් ස්ථාන මාරු ඉල්ලුම් කළ ගාල්ල ප්‍රධාන කාර්යාලය තම පළමු කැමැත්ත ලෙස අයදුම් කිරීමට කැමති නිලධාරීන් | ඇමුණුම 01 |
| දැනටමත් සාමාන්‍ය ස්ථාන මාරු අයදුම්පතක් යොමු කර ඇති ගාල්ල ප්‍රධාන කාර්යාලය වෙත ද ස්ථාන මාරු අයදුම් කිරීමට කැමති නිලධාරීන් | ඇමුණුම 01<br>ආකෘති අංක 08 |
| ස්ථාන මාරු අයදුම්පතක් යොමු කර නොමැති, ගාල්ල ප්‍රධාන කාර්යාලය වෙත නව ස්ථාන මාරු අයදුම්පතක් යොමු කිරීමට කැමති නිලධාරීන් | ආකෘති අංක 01<br>ආකෘති අංක 08 |
| **කළමනාකරණ සේවා නිලධාරී සේවය** | |
| ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන සඳහා දැනටමත් ස්ථාන මාරු ඉල්ලුම් කළ මාතර ප්‍රාදේශීය කාර්යාලය තම පළමු කැමැත්ත ලෙස අයදුම් කිරීමට කැමති නිලධාරීන් | ඇමුණුම 02 |
| දැනටමත් සාමාන්‍ය ස්ථාන මාරු අයදුම්පතක් යොමු කර ඇති මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත ද ස්ථාන මාරු අයදුම් කිරීමට කැමති නිලධාරීන් | ඇමුණුම 02<br>ආකෘති අංක 08 |
| ස්ථාන මාරු අයදුම්පතක් යොමු කර නොමැති, මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත නව ස්ථාන මාරු අයදුම්පතක් යොමු කිරීමට කැමති නිලධාරීන් | ආකෘති අංක 01<br>ආකෘති අංක 08 |

05. ඉහත උපදෙස් පරිදි අයදුම්පත් සම්පූර්ණ කර ආයතන ප්‍රධානී නිර්දේශ සහිතව, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත 2026.05.08 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු ය.

**චන්දිම සී. මුහන්දිරම්ගේ**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.